# වියුක්තයේ පදනම

යෙහෝවා දෙවියන් වහන්සේ අනෙක් දෙවියන්ගෙන් වෙන්වන්නේ වියුක්ත ස්වභාවය නිසා ය. වෛදික ආගම්වල කියැවෙන බ්‍රහ්මන් ද ලෝකය මවා ඇති නමුත් බ්‍රහ්මන් යනු ලෝකය මැවීමෙන් පසුව ලෝකයෙන් වෙන් වූ දෙවි කෙනෙක් නොවේ. බ්‍රහ්මන් යනු ලෝකය ම වෙයි. එමෙන් ම බ්‍රහ්මන් විෂ්ණු දෙවියන් ලෙස ලෝකයට පැමිණෙයි. එබැවින් බ්‍රහ්මන්ට සිරුරක් නැත ආදී වශයෙන් කිවහැකි නොවේ. බ්‍රහ්මන් වියුක්ත දෙවි කෙනෙක් නොවේ. අපට බ්‍රහ්මන් ගැන චිත්ත රූප මවාගත හැකි ය. සංයුක්ත වූ බ්‍රහ්මන් ලෝකය මැවීමෙන් හැර අනෙක් බොහෝ කරුණුවලින් අප දන්නා සාමාන්‍ය දෙවි කෙනකුගෙන් වෙනස් නොවෙයි.

එහෙත් යෙහෝවා දෙවියන් වහන්සේ එසේ නොවේ. ඒ දෙවියන් වහන්සේ වියුක්ත වෙයි. අපට යෙහෝවා දෙවියන් වහන්සේ ගැන චිත්ත රූපයක් මවාගත හැකි නොවේ. එමෙන් ම යෙහෝවා දෙවියන් වහන්සේ බ්‍රහ්මන් මෙන් නොව ලෝකය නිර්මාණය කිරීමෙන් පසුව ඒ ලෝකයෙන් වෙන් වෙයි. යෙහෝවා දෙවියන් වහන්සේ අපට දෘශ්‍යමාන නොවෙයි. අපට ඒ දෙවියන් වහන්සේ සමග සම්බන්ධකම් පවත්වාගත හැක්කේ පූජකයන් ඔස්සේ ය. එකල සිටි ඇතැම් යුදෙව්වන්ට යෙහෝවා දෙවියන් වහන්සේ කතා කළ බව පරණ තෙස්තමේන්තුවේ ඉගැන්වෙයි. ඔවුන් යෙහෝවා දෙවියන් වහන්සේ සමග කතා කෙළේ කෙසේ දැයි සඳහන් නොවුණ ද මෙයින් කියැවෙන්නේ පංචේන්ද්‍රියන්ගෙන් දැන ගැනීමට ලැබෙන ලෝකය ඉක්මවා ඇතැම් දේ දැනගත් පුද්ගලයන් ගැන විය යුතු ය. ඔවුන් පංචේන්ද්‍රියන් ඉක්මවා දැනගත් ලෝකය, එනම් “දියුණු” මනසක් ආධාරයෙන් නිර්මාණය කරගත් ලෝකය, යෙහෝවා දෙවියන් වහන්සේ දැන ගැනීමේ දී, එනම් නිර්මාණය කර ගැනීමේ දී, යොදා ගෙන තිබෙන බව පැහැදිලි ය. යුදෙව් ගෝත්‍රිකයන් විදුලිය කෙටීමට දේවත්වයක් ආරෝපණය කර නිර්මාණය කරගත් යෙහෝවා දෙවියන් වහන්සේ, වර්ධනය කරගත් මනසක් ඇති අය විසින් පංචේන්ද්‍රියන් ඉක්මවා සම්බන්ධකම් පවත්වාගෙන යා හැකි දෙවියන් වහන්සේ කෙනකු බවට පත්කෙරී ඇති බව පැහැදිලි ය.

දෙවියන් වහන්සේ මිනිසා මැව්වා නොව මිනිසා දෙවියන් වහන්සේ මැවූ බව කාල් මාක්ස් පඬිවරයා සඳහන් කර ඇත. යෙහෝවා දෙවියන් වහන්සේ යනු මිනිසාගේ, එනම් යුදෙව්වන්ගේ නිර්මාණයකි. යෙහෝවා දෙවියන් වහන්සේ පිළිබඳ දැනුම පමණක් නොව සියළු දැනුම් මිනිසුන්ගේ නිර්මාණ වෙයි. කාල් මාක්ස් පඬිවරයා තේරුම් නොගත් කරුණ වූයේ එය ය. ඔහු දෙවියන් වහන්සේ මිනිසාගේ නිර්මාණයක් බව තේරුම් ගත්ත ද ඊනියා යථාර්ථය ද මිනිසාගේ නිර්මාණයක් පමණක් බව හා මේ යථාර්ථය ද මිනිසා විසින් නිර්මාණය කෙරී ඇත්තේ යෙහෝවා දෙවියන් වහන්සේ අනුව ගොස් බව තේරුම් නොගත්තේ ය. මෙය වැඩි දුරටත් සාකච්ඡා කළ යුතු කරුණක් වන නමුත් අපට දැනට අවශ්‍ය වන්නේ වියුක්ත ප්‍රවාද ගැන කතා කිරීමට බැවින් අපි නැවතත් ප්‍රවාද දෙසට හැරෙමු.

අපට අවශ්‍ය වන්නේ සිංහලයන් අතර ඇති සංයුක්ත ප්‍රවාද හා බටහිරයන්ගේ වියුක්ත ප්‍රවාද අතර ඇති වෙනස තේරුම් ගැනීම ය. මේ තේරුම් ගැනීම යනු අපෙන් තොරව ඇති යමක් තේරුම් ගැනීමක් නොව, අප විසින් සංයුක්ත ප්‍රවාද හා වියුක්ත ප්‍රවාද යනුවෙන් ප්‍රවාද දෙවර්ගයක් නිර්මාණය කෙරී ඒ දෙවර්ගය අතර ඇති වෙනස්කම් ද නිර්මාණය කර ගැනීමකි. වියුක්ත ප්‍රවාදයක බොහෝ විට සාධාරණ (පොදු) ප්‍රපංචයක් ගැන සඳහන් කෙරෙයි. පොල් පමණක් නොව සියළු වස්තු පොළොවට වැටෙන්නේ ඇයි ද යන ප්‍රශ්නයට පිළිතුරක් ගුරුත්වාකර්ෂණ ප්‍රවාදයෙන් ලැබෙයි. කලින් සඳහන් කර ඇති අන්දමට මෙහි දී පොල් ආදී ගෙඩි වර්ග පමණක් නොව ගල් හා වෙනත් ද්‍රව්‍ය ද ඉර හඳ තාරකා වැනි ඛගෝලීය දෑ ද වස්තු ලෙස සැලකෙයි. වස්තුවක් යනු සාධාරණ වුවකි. ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය ගොඩනැගෙන්නේ එවැනි වූ සාධාරණ වස්තු සඳහා ය. එය එක් පොල් ගෙඩියක් පොළොවට වැටෙන්නේ ඇයි ද යන ප්‍රශ්නයට දෙන පිළිතුරක් නොවේ.

මෙවැනි සාධාරණ ප්‍රපංච පිළිබඳ ව අසන ප්‍රශ්න එසේ අසන්නේ ම යම් රටා නිරීක්ෂණය කිරීමෙනි. පොල් ගෙඩියක් පොළොවට වැටෙන ආකාරය වෙනත් ගෙඩියක් පොළොවට වැටෙන ආකාරයෙන් වෙනස් නොවේ. ඒ සියල්ල පොළොවට වැටෙන්නේ එකම රටාවකට ය. ගෙඩියක් බිමට වැටෙන්නේ නිශ්චලතාවයෙහි සිට ය. ගෙඩිය ගසේ තිබෙන විට පොළොවට සාපේක්ෂව එහි ප්‍රවේගය (වේගය) ශූන්‍ය වෙයි. ගෙඩිය වැටීමට පටන්ගැනීමෙන් පසුව පොළොවට

© Prof. Nalin De Silva

සාපේක්ෂ ව එහි ප්‍රවේගය ක්‍රමයෙන් වැඩිවෙයි. ප්‍රවේගයේ වැඩිවීමේ සීඝ්‍රතාවය ත්වරණය (acceleration) ලෙස හැඳින්වෙයි. ඒ සංකල්පය යොදා ගැනීමෙන් අපට කිව හැක්කේ ගෙඩියක් ත්වරණයක් සහිත ව පොළොවට වැටෙන බව ය. මෙය රටාවකි. සියළු ගෙඩි එක ම රටාවකට පොළොවට ඇද වැටෙයි. මේ රටාව නිරීක්ෂණය ප්‍රවාදයක් ගොඩ නැගීමට රුකුලක් වෙයි. මේ නිරීක්ෂණය, එනම් වස්තු පොළොවට වැටෙන රටාව හඳුනාගැනීම, සාමාන්‍යයෙන් ගැලීලියෝ ගැලීලි විද්වතාගේ නමට බැරවෙයි. වස්තු පොළොවට වැටෙන්නේ එක ම ත්වරණයකින් ය යන්න ඔහුගේ නිරීක්ෂණයක් යැයි කියැවෙයි.

බටහිරයන්ගේ මෙන් නොවුව ද, යම් ආකාරයක සාධාරණ නිරීක්ෂණ අපේ සංස්කෘතියෙහි නැතිවා නොවේ. උඩ පැන්නොත් බිම වැටේ, මිටි තැනින් වතුර ගලා බසී ආදිය යම් ප්‍රමාණයකට එවැනි නිරීක්ෂණ වෙයි. උඩ පැන්නොත් බිම වැටෙන්නේ එක්තරා පුද්ගලයකු පමණක් නොවේ. එය සියල්ලන්ට පොදු වූ ගුණයකි. එසේ ම මිටි තැනින් ගලා බසින්නේ පිරිසිදු ජලය හෝ දිය ඇල්ලකින් කඩා වැටෙන ජලය පමණක් නොවේ. ඒ ගුණය සියළු ජලයට පොදු වූවකි. එහෙත් අපි එතැනින් ඔබ්බට නොයන්නෙමු. උඩ පනින අය මෙන් ම ගස්වලින් ගිලිහෙන ගෙඩි ද එකම ආකාරයකට බිමට වැටෙන බව නිරීක්ෂණය කිරීමට අප උනන්දු වී නැත. අපේ සාධාරණය කිරීම් සීමිත වෙයි. ඒ සීමිත බව හේතුකොටගෙන අපට වියුක්ත සංකල්ප අවශ්‍ය නොවේ. එසේත් නැතහොත් අපට වියුක්ත සංකල්ප හිඟ බැවින් අපේ සාධාරණය කිරීම් සීමිත වෙයි. මිටි තැනින් වතුර ගලා බසී යන්න ද එවැන්නකි. උඩ මට්ටමක ඇති වතුර පහත් මට්ටමකට ගලා බසියි. එහෙත් වතුර ගලා බැසීම ද උඩ පැන්නොත් බිම වැටීම ද එකට සම්බන්ධ කර ගැනීමට අපට නොහැකි විණි.

යම් යම් නිරීක්ෂණ පොදු නිරීක්ෂණ බවට පත්කර ගැනීමට අපට නොහැක්කේ අප එතරම් වියුක්ත ව කල්පනා නොකරන බැවිනි. අප ඉතා වැඩි පුර සිතන්නේ සංයුක්තව ය. එහෙත් කලින් සඳහන් කර ඇති ආකාරයට අපට සාධාරණ, එනම් පොදු නිරීක්ෂණ නැතිවා නොවේ. සියළු සත්ත්වයන්ට පුනරුත්පත්තිය පොදු බව අපි දනිමු. එය මිනිසුන්ට පමණක් සීමා නොකෙරී සියළු සත්ත්වයන්ට ම පොදු වූ ගුණයක් බවට පත් කර තිබීම එක් අතකින් ගත්කල බටහිර සිතුම් පැතුම් රටාව ඉක්මවා යන්නක් වෙයි. බටහිරයෝ මිනිසුන් අනෙක් සත්ත්වයන්ගෙන් වෙන්කර සලකති. අනෙක් සත්තාවයන්ට නොමැති මනසක් මිනිසුන්ට ඇතැයි ඔවුහු විශ්වාස කරති. බටහිර ජීව විද්‍යාව හා සත්ත්ව විද්‍යාව මේ අදහස මත ද පදනම් වෙයි. මිනිසුන්ට අනෙක් සතුන්ට නැති ඇතැම් ගුණ තිබුණ ද මිනිසුන් ද සතුන් ලෙස සැලකීමට අප පුරුදු වී ඇත්තේ ඈත අතීතයේ සිට ය.

බටහිර ආසියාවේ ජීවත් වූවන්ට එවැනි අදහසක් ඇති නොවී ය. පරණ තෙස්තමේන්තුවට අනුව යෙහෝවා දෙවියන් වහන්සේ මිනිසා මවා ඇත්තේ උන් වහන්සේගේ ප්‍රතිබිම්බය (image) තුළ ය. එහෙත් අනෙක් සතුන් ගැන එසේ නොකියැවෙයි. මෙයින් අදහස් වන්නේ මිනිසා අනෙක් සතුන්ට වඩා විශේෂිත බව ය. ඒ කෙසේ වුවත් ඉහත සඳහන් ප්‍රතිබිම්බ කතාව තුළ පරස්පරයක් (විරුද්ධාභාසයක්) ඇති බව පෙනී යා යුතු ය. පරණ තෙස්තමේන්තුව අනුව යෙහෝවා දෙවියන් වහන්සේගේ ප්‍රතිමා නිර්මාණය නොකෙරෙයි. උන්වහන්සේට යම් ස්වරූපයක් හෝ ආකාරයක් (form) නොමැත. එසේ නම් ස්වරූපයක් නොමැති යෙහෝවා දෙවියන් වහන්සේ උන් වහන්සේගේ ප්‍රතිබිම්බය තුළ මිනිසා මවන්නේ කෙසේ ද? මේ පරස්පරයට ඇත්තේ එක් තේරුමකි. යුදෙව්වන්ට තමන් විශේෂිත යැයි සැලකීමට අවශ්‍ය විය. එබැවින් ඔවුහු තමන් මවා ඇත්තේ යෙහෝවා දෙවියන් වහන්සේගේ ප්‍රතිබිම්බය තුළ යැයි කීමට උනන්දු වූහ. ඒ අතර ඔවුන් විසින් දේවත්වය ආරෝපණය කරනු ලැබූ විදුලි කෙටීමට නිශ්චිත ස්වරූපයක් නොමැති බව ඔවුන්ට අමතක විය.

අපි දැන් නැවතත් පුනරුත්පත්ති කතාවට යමු. සියළු සත්ත්වයන්ට පුනරුත්පත්තිය පොදු යැයි කීම වියුක්තකරණයක් නොවේ. මෙහි දී සත්ත්වයන් යන්න වස්තුව වැනි වියුක්ත සංකල්පයක් නොවේ. වස්තුව යන්න පොල් ගෙඩියක් වැන්නක් නොවේ. පොල් ගෙඩියක් අපට සිතෙන් මවාගත හැකි ය. පොල් ගෙඩි වුව ද අපේ සිතෙහි මැවෙයි. අපට පොල් ගොඩක් ගැන සිතා ගත හැකි ය. එලෙස ම සත්ත්වයා යන්න ද අපට සිතෙන් මබා ගත හැකි ය. සත්ත්වයා යන්නෙහි බහුවචනය වූ සත්ත්වයන් ද අපට සිතෙන් මවාගත හැකි ය. එහෙත් වස්තුව යන්න සිතෙන් මවාගත හැක්කක් නොවේ. පොල් ගෙඩි, දෙල් ගෙඩි, ගෙවල් දොරවල් ආදිය පමණක් නොව මිනිස්සු ද වස්තු වෙති. ඒ

© Prof. Nalin De Silva

සියල්ලට ම පොදු වූ ගුණය වස්තුව යන්නෙන් කියැවෙයි. එවැනි වස්තුවක් සිතෙන් මවාගත නොහැක්කේ යෙහෝවා දෙවියන් වහන්සේ සිතෙන් මවා ගත නොහැකි ආකාරයට ම ය.

සියළු සත්ත්වයන්ට පුනරුත්පත්තියක් ඇත යන්න සියළු වස්තු එකම ත්වරණයකින් පොළොවට වැටේ යන්නෙන් වෙනස් වෙයි. ඒ වෙනසට හේතුව සත්ත්වයන් යන්න වියුක්ත සංකල්පයක් නොවීමත් වස්තුව හෝ වස්තු යන්න වියුක්ත සංකල්පයක් වීමත් නිසා පැන නගින්නකි. අපේ සාධාරණය කිරීම් සංයුක්ත මට්ටමට සීමා වෙයි. බටහිරයන්ගේ සාධාරණය කිරීම් සංයුක්තය ඉක්මවා වියුක්තයට යයි. අපේ සාධාරණය කිරීම් එලෙස සාධාරණය කිරීම් ලෙස හැඳින්වීම කෙතරම් දුරට යුක්ති සහගත ද යන ප්‍රශ්නය ද අප හමුවේ ඇත. වෙනත් වචනවලින් කිවහොත් වියුක්ත සංකල්ප නොමැතිව කෙරෙන සාධාරණය කිරීම්වලට සාධාරණය කිරීම් යැයි කිවහැකි ද යන ප්‍රශ්නය මෙහි දී ඉස්මතු වෙයි. ගංගාවෝ ගලා බසිති යන්න සියළු ගංගාවලට පොදු වූවකි. එහෙත් ගංගා යන්න වියුක්ත සංකල්පයක් නොවේ. අපට ගංගා දැකගත හැකිවෙයි. ගංගා ගලායන බව ද අපට දැකගත හැකි වෙයි. එහෙත් වස්තුවක් පොළොවට වැටෙන බව තබා වස්තුවක්වත් අපට දැකගත නොහැකි වෙයි.

අපේ සංස්කෘතිය තුළ වියුක්ත සංකල්ප නොමැතිව කෙරෙන සාධාරණය කිරීම් සඳහා අපි වෙනත් වචනයක් තනා ගනිමු ද? එසේත් නැතහොත් මේ සීමාවන් හා වෙනස්කම් අවබෝධ කරගනිමින් සාධාරණය කිරීම යන වචනය ම අපි අපේ සංස්කෘතිය තුළ ද යොදා ගනිමු ද? ඇතැම් විට අනාගතයේ දී මේ සංයුක්ත සංකල්ප හා වියුක්ත සංකල්ප යොදා ගනිමින් කෙරෙන සාධාරණය කිරීම් අතර ගැටළුව මෝරා ගියහොත් අපට සංයුක්ත සංකල්ප ඇසුරෙන් කෙරෙන සාධාරණය කිරීම් සඳහා වෙනම වචනයක් තනාගැනීමට සිදුවනු ඇත. එතෙක් අපි ඒ වෙනස හැඳින්වීමට සංයුක්ත සාධාරණය කිරීම හා වියුක්ත සාධාරණය කිරීම යන සංකල්ප යොදා ගනිමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva